**යටිනුවර ප්‍රාදේශීය සභාව.**

**මහනුවර දිස්ත්‍රික්කය.**

**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය.**

**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට යටිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.**

**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී මිල දී ගෙන තිබූ රු.1,427,170 ක් වටිනා උපකරණ, ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් සභාවට පරිත්‍යාග ලෙස 2014 වර්ෂයේ දී ලබා දී තිබූ රු.35,964,560 ක් වටිනා වාහන 06 ක් හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් 2001 වර්ෂයේ දී ලබා දී තිබූ රු.265,000 ක් වටිනා මිනි ට්‍රැක්ටරයේ අයිතිය මෙතෙක් සභාවට පවරා නොතිබූ බැවින්, එම වටිනාකම් ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කළයුතු වුවත්, මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ස්ථාවර තැන්පතු 04 ක සමාලෝචිත වර්ෂයට අදාළ රු.541,668 ක පොළී ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 04 කට අදාළව වර්ෂය අවසාන දිනට ගෙවියයුතුව තිබූ රු.1,221,754 ක් ණයහිමියන් යටතේ දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳුණු පාලන ගිණුම්**

**----------------------------**

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පුස්තකාල පොත් වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව, රු.3,213,145 ක් වුව ද, භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව, එම වටිනාකම රු.4,578,383 ක් වූයෙන්, රු.1,365,238 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

**--------------------**

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ අයිතම 07 ක එකතු වටිනාකම රු.78,972,303 ක් වූ අතර, එයින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.497,472 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.32,261,048 ක් වී තිබුණි.

**1.3.4 ගෙවිය යුතු ගිණුම්**

**---------------------**

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති ණයහිමි ශේෂ 02 ක එකතු වටිනාකම රු.59,783,532 ක් වූ අතර, එයින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.853,122 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.28,456,793 ක් වී තිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**------------------------------------**

ගිණුම් විෂයයන් 02 කට අදාළ අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.83,042,963 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**------------------------------------------------------**

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 ප්‍රකාරව සියලු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.39,295,516 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.34,721,435 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.4,574,081 ක වැඩිවීමක් දක්නට ලැබුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**------------------------------------**

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වැදගත් අනුපාත කීහිපයක් පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02 තුළ මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට එම ප්‍රතිශතයේ පිරිහීමක් පෙන්නුම් කෙරිණි..

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ සමුච්චිත අරමුදලේ ශේෂය අඛණ්ඩ අඩුවීමක් දක්නට ලැබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සමස්ත ඌණතාවය ඉකුත් වර්ෂයේ සමස්ත අතිරික්තය සමග සැසඳීමේ දි, රු.36,538,530 ක ඌණතාවයේ වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා 2015 වර්ෂයේ දි ආදායම් විෂයයන් 03 ක ආදායම අඩුවීම හා වියදම් විෂයයන් 04 ක වියදම වැඩිවීම මූලික වශයෙන් හේතු වී තිබුණු බව විගණනයේ දි නිරීක්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015.01.01 දිනට හිග ශේෂය | 2015 වර්ෂය බිල් කිරීම් | 2015 ලැබීම් හිගයෙන් ලැබීම් | 2015 බිල් කිරීම්වලින් ලැබීම් | 2015.12.31 දිනට හිග ශේෂය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,098,159 | 3,879,496 | 1,271,455 | 2,873,898 | 3,832,302 |
| බදු කුළී | 35,000 | 596,750 | 35,000 | 596,750 | -- |
| බලපත්‍ර ගාස්තු | 11,145 | 1,831,210 | -- | 1,831,210 | 11,145 |
| වෙනත් ආදායම් | 28,252,753 | 39,810,026 | 19,511,933 | 2,175,801 | 46,375,045 |
| එකතුව | | | | | 50,218,492 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.50,218,492 ක මුළු ආදායමක් හිඟ හිට තිබුණි.

### 2.3.2 වරිපනම් බදු

පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වසර 05 කට වරක් වරිපනම් බදු තක්සේරු කළයුතු වුවත්, 2006 වර්ෂයේ තක්සේරු වටිනාකම පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයට වරිපනම් බදු අය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිග වරිපනම් බදු රු.3,776,012 ක් වූ අතර, එම වටිනාකම තුළ වර්ෂයක් ඉක්ම වූ හිග වරිපනම් බදු රු.2,776,149 ක් විය. සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම් වූ රු.3,478,195 කින් සියයට 54 ක් පමණක් අය කර ගෙන තිබුණි. වරිපනම් බදු ගෙවීම පැහැර හරින්නන් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) රජයේ දෙපාර්තමේන්තු හා මණ්ඩලවලින් වසර 07 කට වැඩි කාලයක සිට අය නොවී පවතින හිග වරිපනම් බදු ශේෂයරු.706,037 ක් විය.

### 2.3.3 බදු කුළී

2015 අයවැය ලේඛනය අනුව, බදු කුළී ලෙස රු.6,050,000 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද, ඉන් වර්ෂය තුළ දී අය කර ගෙන තිබුණේ රු.596,750 ක මුදලක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 10 ක් පමණ විය.

**2.3.4 බලපත්‍ර ගාස්තු.**

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සෑම වර්ෂයක් සඳහාම බල ප්‍රදේශයේ ව්‍යාපාර සම්බන්ධව සමීක්ෂණයක් සිදු කර, එකී සමීක්ෂණ වාර්තා අනුව බලපත්‍ර ආදායම් බිල් කිරීම් කළයුතු වුවත්, ආදායම් පරීක්ෂක නිලධාරීන් විසින් පිළියෙළ කර තිබූ පරීක්ෂණ වාර්තාව අසම්පූර්ණවීම හේතුවෙන්, බලපත්‍ර ලේඛනය අනුව බලපත්‍ර ආදායම් අය කර ගෙන තිබුණි. බලපත්‍ර ලේඛනය අනුව ව්‍යාපාර 1256 කින් සමාලෝචිත වර්ෂය තුළ බලපත්‍ර ආදායම් එකතු කර ඇතත්, සමීක්ෂණ වාර්තාවට අනුව ව්‍යාපාර 485 ක් හඳුනා ගෙන තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට වෙළඳ බලපත්‍ර ගාස්තු රු.11,145 ක හිඟ ශේෂයක් පැවති අතර, මෙම හිඟය 2011 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතියත්, හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූල 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව ප්‍රකාශිත ව්‍යාපෘතිවලට අදාළ කර්මාන්ත 68 කට පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබූ අතර, ඒ හේතුවෙන්, රු.474,500 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

**2.3.5 වෙනත් ආදායම්.**

-------------------

**(අ) අක්කර බදු.**

----------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු රු.56,290 ක් වූ අතර, එයින් රු.50,510 ක් හෙවත් මුළු හිඟයෙන් සියයට 89 ක් වර්ෂයකට වැඩි කාලයක සිට අය නොවී පැවතිණි.

**(ආ) ජල ගාස්තු.**

--------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි ජල ගාස්තු රු.213,252 ක් වූ අතර, මෙයින් රු.13,612 ක් වර්ෂයක් ඉක්ම වූ ජල පාරිභෝගිකයින් 08 කට අයත් හිඟ ආදායම් විය. ජල සේවා සැපයීමේ දී, දෙපාර්ශවය අතර ඇති කර ගෙන තිබුණු සේවා ගිවිසුමේ 03 වන වගන්තියට අනුව, සභාව කටයුතු නොකිරීම නිසා, දිගින් දිගටම ජල ගාස්තු හිඟ හිට තිබුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

---------------------------

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.436,083 ක් හා මුද්දර ගාස්තු රු.45,725,710 ක් ලැබියයුතුව තිබුණි. සියලු උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තුවලින් රු.12,544,895 කුත් ලැබී ඇති බව ලේකම්වරයා 2016 ජූලි 05 දින මා වෙත වාර්තා කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

විවිධ ණයගැති ශේෂය තුළ රු.506,372 ක අයිතම 03 ක් වසර ගණනාවක සිට පැවතියත්, එම ශේෂයන් අය කර ගැනීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ බිම් මහලේ කඩ කාමර අංක 01, 1981 වර්ෂයේ දී පමණ පුද්ගලයෙකුට බදු පදනම මත පවරා තිබුණි. වර්ෂ ගණනාවක සිට යථෝක්ත කඩ කාමරයෙන් බදු කුළී අය නොවන අතර, බදුකරු ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකරන බව නිරීක්ෂණය විය. ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග පැහැදිලි කර ගැනීමට හැකි වන පරිදි සභාව විසින් ලිපිගොනු නඩත්තු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල දී සභා බල ප්‍රදේශය තුළ වූ අනවසර ඉදි කිරීම් 99 ක් සම්බන්ධව සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ගයන් අනුගමනය කර නොතිබුණි.

(ඇ) ලිඛිත අවසරයක් නොමැතිව ශ්‍රී ලංකා මොබිටෙල් සමාගම විසින් සම්ප්‍රේෂණ කුළුණු 02 ක් සූරියගොඩ හා අමුණුපුර යන ප්‍රදේශවල 2013 වර්ෂයටත් පෙර ඉදි කර තිබුණි. මෙම අනවසර ඉදි කිරීම් සම්බන්ධව අවශ්‍ය නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) දැනට සභාවේ කටයුතු සම්බන්ධව අධිකරණයේ නඩු 47 ක් විභාග වෙමින් පවතින අතර, ඒ සම්බන්ධව පෙනී සිටින නීතිඥවරු 04 දෙනෙකු වෙනුවෙන් 2014 හා 2015 වර්ෂවල දී රු.960,250 ක් ගෙවා තිබුණි. මෙම නඩු 47 න් 35 ක්ම වර්ෂයකට වැඩි කාලයක සිට විභාග වෙමින් පැවතින.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය.

--------------------------------

#### 3.3.1 පිලපිටිය කරුදූගස්පිටිය පාර සංවර්ධනය කිරීම - රු.500,000

-----------------------------------------------------------------

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2016 ජනවාරි 22 දින කරන ලද භෞතික පරික්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) වැඩ විෂය අංක 07 යටතේ ඉදි කර තිබූ සක්ක බැම්ම සඳහා 6"X9" ප්‍රමාණයේ ගල් යොදා ගතයුතු වුවත්, 6"X14", 8"X12" යනා දී ප්‍රමාණයෙන් විශාල ගල් යොදා බැම්ම ඉදි කර තිබුණි.

(ආ) 1:5 සිමෙන්ති වැලි මිශ්‍රණයෙන් ආරක්ෂිත බැම්ම බැඳියයුතු වුවත්, අතින් කැඩිය හැකි මට්ටමේ දුර්වල බදාම මිශ්‍රණයක් යොදා ඉදි කිරීම් කර තිබුණි.

(ඇ) මාර්ගය ආරම්භයේ බැම්මේ කොටසක් ඉදි කර නැවත මීටර් 30 ක් පමණ දුරින් ඉතිරි කොටස ඉදි කර තිබුණි. එම කොටස් දෙක අතර මාර්ගයේ යාබදව පිහිටි නිවසක වැසිකිළි පද්ධතිය මාර්ගයේ කොටසක් යා වන ලෙස ඉදි කර තිබූ බැවින්, මාර්ගය භාවිතා කිරීමට නොහැකි වී තිබුණි. මේ නිසා, වැය කළ මුදලින් නිසි ප්‍රයෝජන ගැනීමට නොහැකි වී තිබුණි.

**3.3.2 දෙහිදෙණිය මාර්ගයේ සිට ඉහළ ගොඩැල්ල මාර්ගයේ පස් පුරවා බෝක්කු ඉදි කිරීම - රු.400,000**

-----------------------------------------------------------------------------------------

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2016 ජනවාරි 22 දින කරන ලද භෞතික පරික්ෂාවේදී පහත කරුණු අණාවරණය විය.

(අ) ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 03 යටතේ පතුලේ ඝනකම අඟල් 4 ක් සහිතව කාණු කොන්ක්‍රීට් කිරීම කළයුතු වුවත්, කාණුවේ පතුල ස්ථාන කීපයකින් කඩා පරික්ෂා කිරීමේ දී එහි ඝනකම අඟල් 02 ක ප්‍රමාණයෙන් ඉදි කර තිබුණි. මේ සඳහා රු.18,821 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(ආ) 1:5 සිමෙන්ති වැලි මිශ්‍රණයෙන් ආරක්ෂිත බැම්ම ඉදි කළයුතු වුවත්, අතින් කැඩිය හැකි මට්ටමේ දුර්වල බදාම මිශ්‍රණයක් යොදා ඉදි කිරීම් කර තිබුණි.

(ඇ) වැඩ විෂය අංක 07 යටතේ ඉදි කර තිබූ සක්ක බැම්ම සඳහා 6"X9" ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයේ ගල් යොදා තිබුණි.

**3.3.3 ප්‍රගති මන්දිරය සංවර්ධනය කිරීම - රු.490,000**

-----------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදි කිරීමට පෙර, ඊට අදාළ සැළසුම් පිළියෙළ කර, ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගතයුතු වුවත්, සැළසුම් සකස් කිරීමකින් තොරව ගොඩනැගිල්ල ඉදි කරමින් පැවති බව 2016 ජනවාරි 22 දින කරන ලද භෞතික පරීක්ෂණයේ දී නිරීක්ෂණය විය.

(ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ නියමයන්ට අනුව, ගොඩනැගිලි ඉදි කිරීම් සඳහා සංවර්ධන බලපත්‍රයක් ලබා ගතයුතු වුවත්, එසේ කටයුතු කර නොතිබූ අතර, වීථි රේඛා සහතික ලබා ගෙන නොතිබුණි.

(ඇ) යථෝක්ත ගොඩනැගිල්ල ඉදි කරන ඉඩම විහාරස්ථානයකට අයත්ව පැවති බව නිරීක්ෂණය විය.

(ඈ) ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා වාර්තාවේ 06 වන ඡේදයට අනුව, ව්‍යාපෘති යෝජනාවේ වර්තමාන තත්ත්වය ලෙස දැනට පොදු සමිති ශාලාවක් නොමැති බව දක්වා ඇතත්, පේරාදෙණිය ප්‍රගති සංවිධානයේ පවතින දෙමහල් ගොඩනැගිල්ලේ කොටස් ව්‍යාපාරික කටයුතු සඳහා බදු දී ඇති බැවින්, සක්‍යතා වාර්තාවෙන් සාවද්‍ය තොරතුරු ලබා දී ඇති බවක් නිරීක්ෂණය විය.

**3.3.4 කොන්ත්‍රාත් ඉටු කිරීමේ ප්‍රමාදය.**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට සැළසුම් කළ රු.15,831,263 ක් වටිනා ව්‍යාපෘති 50 ක් අදාළ වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

### 4.1 අයවැය පාලනය.

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 02 ක සියයට 30 සිට සියයට 90 ක් දක්වා ද, වියදම් විෂයයන් 06 ක සියයට 16 සිට සියයට 79 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

**4.2 වත්කම් කළමනාකරණය.**

**-----------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**--------------------------------------------**

රු.1,200,000 ක් වටිනා කෘෂ කැබ් රථය ඌණ උපයෝජිතව පැවති අතර, රු.5,672,300 ක එකතු වටිනාකමක් සහිත ඩබල් කැබ් රථයක්, ට්‍රැක්ටර් 04 ක් හා ට්‍රේලර් 03 ක් ද නිෂ්ක්‍රීයව පැවතුණි.

**5. පද්ධති හා පාලනය.**

**-----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය

(ආ) ණයගැති/ණයහිමි පාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඇ) කොන්ත්‍රාත් පාලනය